# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2103/2 - 2018 දෙසැම්බර් මස 24 වැනි සඳුදා - 2018.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.02.27 දිනැති අංක 1434/5 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පළකරන ලදුව 2005.08.01 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාර ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 දෙසැම්බර් මස 21 වැනි දින.

**01. ක්‍රියාත්මක වන දිනය :**
මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2018.12.24 දින සිට ක්‍රියාත්මක වේ.

**02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

2.1 පත් කිරීමේ බලධරයා : සර්වේයර් ජනරාල් තනතුර සඳහා පත්කිරීමේ බලධරයා අමාත්‍ය මණ්ඩලය වන අතර සර්වේයර් ජනරාල් තනතුර හැර සේවයේ අනෙකුත් තනතුරු සඳහා පත්කිරීමේ බලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

**03. සේවා ගණ පිළිබඳ විස්තර**

3.1 සේවා ගණ : ජ්‍යෙෂ්ඨ විධායක
විධායක

3.2 ශ්‍රේණිඃ

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ විධායක | විශේෂ ශ්‍රේණිය |
| විධායක | I ශ්‍රේණිය |
| විධායක | II ශ්‍රේණිය |
| විධායක | III ශ්‍රේණිය |

1A - G 29139 — 09 (2018/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :
මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් සර්වේයර් ජනරාල් වෙත වර්ෂ 2002 අංක 17 දරන මැනුම් පනත සහ අනිකුත් ආනුශංගික අණපනත්වලින් පැවරී ඇති කාර්යයන් සහ ඔහු වෙත නිශ්චිත කොට පැවරෙන මිනින්දෝරු විෂයට අදාළ වෙනත් කාර්යයන් මෙම සේවාවේ තනතුරු දරන්නන් විසින් ඉටුකරනු ලැබිය යුතුය.

**04. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත**

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය - ජ්‍යෙෂ්ඨ විධායක - SL- 03 - 2016
විධායක - SL- 01-2016

5.2 වැටුප් පරිමාණය ජ්‍යෙෂ්ඨ විධායක - SL-03-2016
රු. 88,000 - 12 X 2700 - 120,400/-

විධායක - SL-01-2016
රු. 47,615 - 10 X 1335 - 8 X 1630 - 17 X 2170 - 110,895/-

5.3 සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය සහ ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *වැටුප් තලය* |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 01 SL - 1 - 2016 | රු.47,615 |
| II ශ්‍රේණිය | පියවර 12 SL - 1 - 2016 | රු.62,595 |
| I ශ්‍රේණිය | පියවර 20 SL - 1 - 2016 | රු.76,175 |
| විශේෂ ශ්‍රේණිය | පියවර 01 SL - 3 - 2016 | රු.88,000 |

**06. සේවා ගණයන්ට අයත් තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාම (ශ්‍රේණිය)* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|
| සර්වේයර් ජනරාල් (විශේෂ ශ්‍රේණිය) | 1 | මැනුම් පනත සහ අනිකුත් ආනුශංගික අණපනත්වලින් පැවරී ඇති රාජකාරි සහ සර්වේයර් ජනරාල් වෙත නිශ්චිත කොට පැවරෙන අදාළ වෙනත් රාජකාරි මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම |
| අතිරේක සර්වේයර් ජනරාල් (විශේෂ ශ්‍රේණිය) | 3 | මැනුම් පනත සහ අනිකුත් ආනුශංගික අණපනත්වලින් පැවරී ඇති රාජකාරි සහ සර්වේයර් ජනරාල් විසින් නිශ්චිත කොට පවරනු ලබන වෙනත් රාජකාරි මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (විශේෂ ශ්‍රේණිය) | 5 | |
| නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/ පළාත් සර්වේයර් ජනරාල් (විශේෂ ශ්‍රේණිය) | 15 | |

| *අනුමත තනතුරු නාම (ශ්‍රේණිය)* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (I ශ්‍රේණිය) | 60 | මැනුම් පනත සහ අනිකුත් ආනුශංගික අණපනත්වලින් පැවරී ඇති රාජකාරි සහ සර්වේයර් ජනරාල් විසින් නිශ්චිත කොට පවරනු ලබන වෙනත් රාජකාරි ඉටුකිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම |
| මිනින්දෝරු අධිකාරී (II ශ්‍රේණිය ) | 139 | මැනුම් පනත සහ අනිකුත් ආනුශංගික අණපනත්වලින් පැවරී ඇති රාජකාරි සහ සර්වේයර් ජනරාල් විසින් නිශ්චිත කොට පවරනු ලබන වෙනත් රාජකාරි ඉටුකිරීම හා අධීක්ෂණය කිරීම |
| සහකාර මිනින්දෝරු අධිකාරී /මිනින්දෝරු (III ශ්‍රේණිය ) | 850 | මැනුම් පනත සහ අනිකුත් ආනුශංගික අණපනත්වලින් පැවරී ඇති රාජකාරි සහ සර්වේයර් ජනරාල් විසින් නිශ්චිත කොට පවරනු ලබන අදාළ වෙනත් රාජකාරි ඉටුකිරීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 1049
ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරෙහි සේවය කරන, 2002 අංක 17 දරන මැනුම් පනත අනුව මැනුම් සභාවේ ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු වන පහත සඳහන් සුදුසුකම් සපුරන නිලධාරීන්ගෙන් සේවයේ III ශ්‍රේණියට සියළුම බඳවා ගැනීම් කරනු ලැබේ.

(i) මැනුම් විද්‍යා උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගන්නා ලද නිලධාරියෙකු නම්, මාස හය (06) ක දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් සමග මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස යටත් පිරිසෙයින් වසර තුන (03) ක් සක්‍රීය හා සතුටුදායක ලෙස සේවය කර තිබීම.

(ii) මැනුම් විද්‍යා නොවන වෙනත් උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගන්නා ලද නිලධාරියෙකු නම්, මැනුම් විද්‍යා උපාධියක් සම්පූර්ණ කිරීම හා ඉන් අනතුරුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස යටත් පිරිසෙයින් වසර තුන (03) ක් සක්‍රීය හා සතුටුදායක ලෙස සේවය කිරීම.

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රමය (අ) පරිශිෂ්ටයෙහි ඇතුළත් වේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්**

8.1

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණ/ වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියට පත්වීමෙන් වසර තුන (03) ගතවීමට පෙර | "ආ"පරිශිෂ්ටය බලන්න |

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණ/ වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II ශ්‍රේණියට උසස්වීමෙන් වසර තුන (03) ගතවීමට පෙර | "ආ"පරිශිෂ්ටය බලන්න |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ I ශ්‍රේණියට උසස්වීමෙන් වසර පහ (05) ගතවීමට පෙර | "ආ"පරිශිෂ්ටය බලන්න |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වර්ෂයකට දෙවතාවක් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :
1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය "ආ"පරිශිෂ්ටයේ සඳහන් ආයතන විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

**09. භාෂා ප්‍රවීණතාව**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස, රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබූ නිලධාරියෙකු ආධුනික කාලය තුළ එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයට බඳවා ගනු ලැබූ නිලධාරියෙකු, එසේ බඳවා ගනු ලැබීමෙන් වසර 5 ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව III කාණ්ඩයේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය. |
| 03. සන්ධාන භාෂාව | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයට බඳවා ගනු ලැබූ නිලධාරියෙකු, එසේ බඳවා ගනු ලැබීමෙන් පසු වසර 5 ක් ඇතුළත අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් සමත්ව තිබීම (වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) හෝ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විසින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පවත්වන විශේෂ විභාගයෙන් සමත්ව තිබීම යන සුදුසුකමක් සපුරා තිබිය යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම්**

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ II ශ්‍රේණියේ වසර හතක (07) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හතක් (07) උපයාගෙන තිබීම.
II. සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී තිබීම.
III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වසර හතක් (07) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඉහල කාර්ය සාධන මට්ටමක් ළඟා කරගෙන තිබීම.
V. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් මැනුම් විද්‍යාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මැනුම් විද්‍යා ක්ෂේත්‍රයට අදාළ විෂය ක්ෂේත්‍රයක හෝ ඉඩම් පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

10.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පවතින පුරප්පාඩු සංඛ්‍යාව නොසලකා සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් මැනුම් විද්‍යාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මැනුම් විද්‍යා ක්ෂේත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රයක හෝ ඉඩම් පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
II. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.
III. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විධායක සේවා ගණයේ වසර 18 කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 5 තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.
V. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සපුරාලන නිලධරයන්ගේ සේවයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව සේවයේ විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

11. **තනතුරුවලට පත්කිරීම**

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් |
|---|---|
| සර්වේයර් ජනරාල් | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| අතිරේක සර්වේයර් ජනරාල් | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/පළාත් සර්වේයර් ජනරාල් | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| මිනින්දෝරු අධිකාරී | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II වන ශ්‍රේණියේ හෝ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |

11.2 තෝරා ගනු ලබන ක්‍රමය :

| තනතුර | සුදුසුකම් |
|---|---|
| සර්වේයර් ජනරාල් | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබේ. |
| අතිරේක සර්වේයර් ජනරාල් | සර්වේයර් ජනරාල් හැර ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අතිරේක සර්වේයර් ජනරාල් තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | සර්වේයර් ජනරාල් සහ අතිරේක සර්වේයර් ජනරාල්වරුන් හැර ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ විශේෂ ශ්‍රේණියේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |
| නියෝජ්‍ය සර්වේයර් ජනරාල් / පළාත් සර්වේයර් ජනරාල් | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් අතරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව |
| නියෝජ්‍ය සර්වේයර් ජනරාල් / පළාත් සර්වේයර් ජනරාල් | තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |
| ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී | මිනින්දෝරු අධිකාරී තනතුරු දරන ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. (තනතුරට පත් කිරීමේදී වැඩ බැලීම්/ රාජකාරි ඉටු කිරීම් පත්වීම් ලබා දී ඇති නිලධාරීන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) |
| මිනින්දෝරු අධිකාරී | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් හැර ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ I වන ශ්‍රේණියේ හෝ II වන ශ්‍රේණියේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව මිනින්දෝරු අධිකාරී තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :**

(අ) අනිවාර්ය සේවා කාලය
මැනුම් විද්‍යා උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස පත්වීම ලබන නිලධාරීන්, මිනින්දෝරුවරයෙකු ලෙස පත්වීම ලබන දින සිට වසර හය (06) ක අනිවාර්ය සේවා කාලයකටද, වෙනත් උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස පත්වීම ලබන නිලධාරීන් මිනින්දෝරුවරයෙකු ලෙස පත්වීම ලබන දින සිට වසර අට (08) ක අනිවාර්ය සේවා කාලයකටද, යටත් වේ. ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස පත්වීමක් ලබන සෑම නිලධාරියෙකුම සර්වේයර් ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතු අතර අනිවාර්ය සේවා කාලයට පෙර ඉවත්වන නිලධාරීන් සම්බන්ධව එම ගිවිසුම ප්‍රකාර කටයුතු කළ යුතුය.

(ආ) සේවාරම්භ පුහුණුව :

(i) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවාගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන්ට දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දෙනු ඇත.

(ii) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවාගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් නොවන අනෙකුත් උපාධි සහිත නිලධාරීන්, ඔවුන්ගේ දෙවන උපාධිය ලෙස මැනුම් විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධි පාඨමාලාවක් මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේදී සාර්ථකව නිම කළ යුතු අතර දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් ද ලබා දෙනු ඇත.

(ඇ) සේවාස්ථ පුහුණුව:
සේවාස්ථ පුහුණු පාඨමාලා මගින් නිලධාරීන්ට වෘත්තීය දැනුම අඛණ්ඩව ලබා දෙනු ඇත. සේවයේ සියලුම නිලධාරින්ගේ වෘත්තීය අභිවෘද්ධි අවශ්‍යතා මෙම පුහුණු පාඨමාලා මගින් ලබාදෙනු ඇත.

13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

(i) " ගැසට් පත්‍රය" යනුවෙන් අදහස් කෙරෙනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයයි.

(ii) " සේවය " යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයයි.

(iii) " සේවා ව්‍යවස්ථාව " යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථාව වේ.

(iv) "අමාත්‍යාංශයේ ලේකම් " යනුවෙන් අදහස් කෙරෙන්නේ මිනින්දෝරු විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

(v) "මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය" යනුවෙන් අදහස් කෙරෙනුයේ 1969 අංක 21 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය වේ.

(vi) "2005.08.01 ව්‍යවස්ථාව" යනුවෙන් අදහස් කෙරෙන්නේ 2005.08.01 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.02.27 දින අංක 1434/5 දරණ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සහ එහි සංශෝධන වේ.

(vii) "සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

(viii) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය, මෙම ව්‍යවස්ථාවට යා කොට ඇති "ඇ " පරිශිෂ්ඨයේ දැක්වෙන ඕනෑම දෙපාර්තමේන්තුවක එම සේවයේ ඉහත සඳහන් කර ඇති පන්තිවලට හෝ ශ්‍රේණිවලට පත් කරන ලද රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වනු ඇත.

14. **පුරප්පාඩු සංඛ්‍යාව සහ බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීම**

සහකාර මිනින්දෝරු අධිකාරී / මිනින්දෝරු තනතුරු සඳහා අනුමත තනතුරු සංඛ්‍යාවෙන්, එම තනතුරු වල සේවයේ යෙදී සිටින නිලධාරීන් සංඛ්‍යාවේ සහ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරෙහි සේවයේ යෙදී සිටින නිලධාරීන් සංඛ්‍යාවේ එකතුව අඩු කිරීමෙන් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරෙහි පුරප්පාඩු සංඛ්‍යාව ගණනය කරනු ලැබේ. බඳවා ගැනීම සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව ලෙස සලකනු ලබන්නේ එම වර්ෂයේ ජූනි 30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

මෙහිදී සහකාර මිනින්දෝරු අධිකාරී, මිනින්දෝරු, ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවල සේවයේ යෙදී සිටින නිලධාරීන් සංඛ්‍යාව සහකාර මිනින්දෝරු අධිකාරී / මිනින්දෝරු තනතුරු සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව නොඉක්මවිය යුතුය.

15. **සේවයට බඳවා ගැනීම, සේවයේ ස්ථිර කිරීම සහ ශ්‍රේණි ගත උසස්වීම් සිදුකිරීම**

(අ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයට අළුතින් බඳවා ගැනීම් සිදුකරන්නේ III ශ්‍රේණියට පමණක් වන අතර ශ්‍රේණිගත උසස්වීම් මෙම ව්‍යවස්ථාවේ දක්වා ඇති ක්‍රමවේද යටතේ පමණක් සිදුකළ යුතුය.

(ආ) 12 වන ඡේදයේ පරිදි ඔවුන් ආධුනික පුහුණුව සාර්ථකව නිමකිරීම, රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බඳවා ගන්නා ආධුනික මිනින්දෝරුවරුන් තනතුරේ ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක අදාළ ප්‍රවීණතාවය ලබා ගැනීම, සහ ආධුනික මිනින්දෝරුවෙකු ලෙස සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාම සපුරා තිබේනම් සහ මෙම සේවා ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ නම් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන සේවයේ ස්ථිර කරනු ලැබේ.

**16. විශ්‍රාම ගැන්වීමේ විකල්පය**

මෙම සේවා ව්‍යවස්ථා ගැසට් නිවේදනය පළවූ දිනය වනවිට සේවයේ සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නැති නිලධාරියෙකුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමේ වරප්‍රසාදය පිරිනැමිය යුතු තරමට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන වලින් අහිතකර බලපෑමක් ඇතිවී ඇතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත් වන්නේ නම් මෙම සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට වර්ෂ පහක් (5) ක් ඇතුළත එම මනාපය ප්‍රයෝජනයට ගැනීමට යටත්ව නිලධාරියෙකු ඉල්ලීමක් කළහොත් එසේ විශ්‍රාම ගැනීමට ඉඩදෙනු ඇත.

**17. සේවයේ නියුතු නිලධාරීන් ප්‍රතිසංවිධිත සේවයේ නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති SL-01-2016 හා SL-03-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

(i) සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ සිටින නිලධාරීන් සේවයේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

(අ) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ II වන පන්තියේ I වන ශ්‍රේණියේ සිටින නිලධාරීන් සේවයේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ආ) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පැරණි සේවා ව්‍යවස්ථාවේ 7.3 වගන්තිය යටතේ II වන පන්තියේ I වන ශ්‍රේණියට පත්වීම් ලද නිලධාරීන් I වන ශ්‍රේණියට උසස්වීමේ අයිතිවාසිකම රහිතව II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ I වන පන්තියේ සිටින නිලධාරීන් සේවයේ I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iv) සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ තෝරාගත් පන්තියේ සිටින නිලධාරීන් සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**18. අන්තර්කාලීන විධිවිධාන :**

අන්තර්කාලය මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට වසර පහක් ඉදිරියට බලපැවැත්වේ.

18.1 අන්තර්කාලය තුළදී මෙම සේවා ව්‍යවස්ථාවේ 10.2.1 හි (V) හෝ 10.3.1 හි (I) හි සඳහන් සුදුසුකම් වලට විකල්ප සුදුසුකම් ලෙස මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විසින් පවත්වන මැනුම් විද්‍යාව පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව හෝ මැනුම් විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් මේ හා සමාන හෝ ඉන් ඉහළ මැනුම් විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් හෝ පිළිගනු ලැබේ.

18.2 මෙම ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ වන දිනය වන විට 2006.02.27 දිනැති අංක 1434/5 දරණ අති විශෙෂ ගැසට් නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව අනුව I පන්තියේ වසර පහ (05) ක සක්‍රීය සේවා කාලයක් ඉක්මවා ඇති නිලධාරීන් 8.1 යටතේ දක්වා ඇති තෙවන (3) කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් මුදාහරිනු ලැබේ.

18.3 මෙම සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ වන දිනය වන විට I පන්තියට උසස් වී තිබුණද I පන්තියට උසස් වීමෙන් පසු වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක 05 ක් උපයා ගෙන නොමැති නිලධාරීන් සඳහා මෙම සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් වන දින සිට වසර 05 ක සහන කාලයක් දෙනු ලැබේ.

18.4 2005.08.01 ව්‍යවස්ථාව අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය 1 සහ 2 සමත්වූ සේ සලකනු ලැබූ නිලධාරීන් තවදුරටත් මෙම ව්‍යවස්ථාව යටතේද මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය 1 සහ 2 සමත්වූ සේ සලකනු ලැබේ.

18.5 2005.08.01 ව්‍යවස්ථාවේ 7.1 වගන්තිය අනුව සේවයේ II/II පන්තියට අන්තර්ග්‍රහණය කිරීමට සුදුසුකම් නොලැබූ සේවයේ III / I, III/ II, III/III පන්ති වල සේවය කළ මිනින්දෝරුවරුන් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියට පත් කිරීමට සුදුසුකම් ලබන තෙක් වර්තමාන පන්තියේ / ශ්‍රේණියේ සිටිය යුතුය. ඔවුන් 2005.08.01 ව්‍යවස්ථාවේ 7.1 වගන්තියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීම මත එම කොන්දේසිවලට යටත්ව සේවයේ III ශ්‍රේණියට පත් කිරීම සිදු කරනු ලැබේ.

18.6 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ට I වන ශ්‍රේණියට උසස් වීම් ලබා දීමේදී අන්තර්කාලය තුළදී අදාළ කර ගත යුත්තේ 2006.02.27 දිනැති අංක 1434/5 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන වන අතර එය 2018.12.31 වන දක්වා පමණක් ක්‍රියාත්මක වේ.

18.7 2005.08.01 ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේදී එම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව බඳවා ගනු ලැබේ.

18.8 2018.12.31 දිනෙන් පසු මෙම සේවා ව්‍යවස්ථාව යටතේ පළමුවන ශ්‍රේණියට උසස් වීම සඳහා අවශ්‍ය අවම සේවා කාලය සම්පූර්ණ කරන තෙක් එනම් 2022.08.01 දින තෙක් පුරප්පාඩු වන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ වැඩ බැලීමේ පදනම හෝ රාජකාරි ඉටුකිරීමේ පදනම මත නිලධාරීන් පත්කරනු ලැබේ. මෙම වැඩ බැලීමේ පත්වීම දෙවන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවය අනුව ලබාදෙන අතර යම් නිලධාරියෙකු එම වැඩබැලීමේ/ රාජකාරි ඉටුකිරීමේ පත්වීම දෙනු ලබන අවස්ථාවේ භාර නොගන්නේනම් වසර 02ක් ගත වන තුරු නැවත වැඩබැලීමේ / රාජකාරි ඉටුකිරීමේ පත්වීමක් ලබා දීම සඳහා සලකා බලනු නොලැබේ.

(ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී තනතුර සඳහා ස්ථිර පත්වීම් ලබා දීමේදී වැඩ බැලීමේ/ රාජකාරි ඉටුකිරීමේ පත්වීම් ඉටුකරනු ලබන නිලධාරීන් හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී තනතුර වැඩ බැලීමේ/ රාජකාරි ඉටුකිරීමේ පත්වීම් ඉටුකරන නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී පත්වීම් ලබා දීමෙන් අනතුරුව වැඩ බැලීමේ/ රාජකාරි ඉටුකිරීමේ පත්වීම් ඉටු නොකළ නිලධාරීන් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී තනතුරට පත් කෙරේ.)

**19. රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන ප්‍රවීණතා**

මෙම ව්‍යවස්ථාවේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි අවශ්‍යවන ප්‍රවීණතා සහ නිපුණතාවයන්ද සියලු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබාගත යුතුය.

**20. ජ්‍යෙෂ්ඨත්වය**

ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III වන ශ්‍රේණියට පත් කිරීමේදී ජ්‍යෙෂ්ඨතාවය තීරණය කිරීමේ නිර්ණායකය වනුයේ ආධුනික මිනින්දෝරු සේවා කාලය අවසානයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් "ඈ" පරිශිෂ්ටය ප්‍රකාරව පවත්වනු ලබන විභාගයෙන් ඒ ඒ නිලධාරීන් ලබා ගන්නා ලකුණු මට්ටම ය.

ආධුනික මිනින්දෝරු තනතුරට විවෘත බඳවාගැනීම (තරඟ විභාග ප්‍රතිඵල මත) සහ කුසලතා මත බඳවාගැනීම (සම්මුඛ පරීක්ෂණ ලකුණු මත) එකම දිනයකදී සිදුකළ විට කුසලතා මත බඳවා ගත් නිලධාරීන් ජ්‍යෙෂ්ටත්වයෙන් වැඩිසේ සලකා කටයුතු කරනු ලැබේ.

**21. විධිවිධාන සලසා නොමැති කරුණු**

මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධානවලට පරිබාහිරවූ කරුණු පිළිබඳ තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

පරිශිෂ්ටය "අ"

**ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගැනීම් ක්‍රමය**

නියමිත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීමට හැකි වන සේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

**1. බඳවා ගන්නා අනුපාතය**

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 90% |
| කුසලතා | 10% |

සටහන :

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේදී බඳවා ගනු ලබන සංඛ්‍යාවෙන් 90%ක් නියමිත සුදුසුකම් සහිත උපාධිධාරීන්ගෙන් විවෘත තරග විභාගයක් මගින් බඳවා ගනු ලබන අතර ඉතිරිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරක සේවය කරන සේවයේ ස්ථිර කර ඇති නියමිත සුදුසුකම් සහිත අවම වශයෙන් වසර පහ (5) ක සක්‍රීය හා සතුටුදායක සේවාකාලයක් ඇති නිලධාරීන්ගෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් කුසලතා බඳවා ගැනීම් ක්‍රමය යටතේ බඳවා ගනු ලැබේ. එසේ වුවද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරුන් වශයෙන් පුහුණු කිරීම සඳහා තෝරා ගැනීමට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් කුසලතා බඳවා ගැනීම් යටතේ බඳවා ගැනීමට නොහැකි නම්, එම පුරප්පාඩු සඳහාද විවෘත බඳවා ගැනීම මගින් තෝරාගත් උපාධිධාරීන් බඳවා ගනු ලැබේ.

විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමේදී මැනුම් විද්‍යා උපාධිධාරීන් සහ අනෙකුත් උපාධිධාරීන් 9 :1 අනුපාතයට බඳවා ගනු ලැබේ. මැනුම් විද්‍යා උපාධිධාරීන් අවශ්‍ය ප්‍රමාණයට නොමැති නම් එම ප්‍රමාණය අනෙකුත් උපාධිධාරීන්ගෙන් සම්පූර්ණ කරනු ලබන අතර අනෙකුත් උපාධිධාරීන් අවශ්‍ය ප්‍රමාණයට නොමැති නම් එම ප්‍රමාණය මැනුම් විද්‍යා උපාධිධාරීන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

**2. විවෘත බඳවා ගැනීම**

2.1 සුදුසුකම් :

2.1.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් /ආයතනයකින්

(i) මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හෝ

(ii) විද්‍යාවේදී විශේෂ උපාධියක් (ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ පරිගණක /තොරතුරු තාක්ෂණ විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ) හෝ

(iii) ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් හෝ

(iv) පංති සාමාර්ථයක් සහිතව පරිගණක /තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධියක් හෝ

(v) පංති සාමාර්ථයක් සහිතව ගණිතය හෝ භෞතික විද්‍යාව විෂයයන් සහිතව සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් තිබීම

සහ

(ආ) අ.පො.ස. උසස් පෙළ සඳහා ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් සමත්ව තිබීම.

2.1.2 වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද : අදාළ නොවේ

2.1.3 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සුදුසු සෑම අයුරකින්ම ශාරීරික යෝග්‍යතාවයක් ඇති ත්‍රිමාණ පෙනීම සහිත සහ වර්ණ අන්ධතාවය නොමැති පුද්ගලයෙකු විය යුතුය.

2.1.4 වෙනත් :

(i) ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) යම් ආගමික නිකායක පැවිදි ධූරයක් දරන තැනැත්තන් මෙම තනතුරට බඳවා ගනු නොලබන අතර එවැනි අයට මෙම තනතුර සඳහා අයදුම් කල නොහැක. එසේම බඳවාගැනීමේ විභාගය සඳහා පෙනී සිටීමට කිසිදු අවසරයක් නොමැත.

(iv) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය වශයෙන් සඳහන් කරන දිනට මෙම පරිශිෂ්ඨයෙහි සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීමට සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

2.1.5 වයස

2.1.5.1 අවම වයස් සීමාව : අවුරුදු 22

2.1.5.2 උපරිම වයස් සීමාව : අවුරුදු 28

2.2 බඳවාගැනීමේ ක්‍රමය :

විභාග කොමසාරිස් ජනරාල් හෝ සර්වේයර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක් මගින් බඳවා ගනු ලැබේ. සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් ලකුණු 40%ක් ලබා සියළුම විෂයයන් සමත් වූ අයදුම්කරුවන්, ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සහ සාමාන්‍ය කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය පිළිබඳ විස්තරඃ

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වෙන අතර අයදුම්කරුවන්ට පෙනීසිටිය හැක්කේ එක් මාධ්‍යකින් පමණක් වන අතර විභාගය සඳහා ඉල්ලුම්කල මාධ්‍යය පසුව වෙනස් කල නොහැක. මෙම විභාගය පහත සඳහන් පරිදි විෂයන් තුනකට අදාළව ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත වන අතර සෑම අයදුම්කරුවෙක්ම විෂයයන් තුනටම පෙනීසිටිය යුතුය.

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1 | අවබෝධය | පැය 2 | 100 | 40 |
| 2 | බුද්ධි පරීක්ෂණය | පැය 2 | 100 | 40 |
| 3 | සාමාන්‍ය දැනීම | පැය 2 | 100 | 40 |

**අවබෝධය :** පැය දෙක (2) ක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍ර මගින් කෙටි පාඨ ගණනාවක් අයදුම්කරුවන් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙනු ලබන්නේ එක් වාක්‍යයකින් ප්‍රකාශ කිරීම පිණිසයි. යටින් ඉරි ඇඳි පදවලට විවරණ සැපයීමේ ප්‍රශ්නද දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරුවන් වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, ඉන් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපෙයි. අයදුම්කරුවන් මෙයින් වඩාත් උචිත ප්‍රකාශය තෝරා ගත යුතුය. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරු වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනු ඇත. ඒවාට නිවැරදි පිළිතුරු දීම අපේක්ෂා කෙරේ. මේ ප්‍රශ්න පිළියෙල කරන්නේ අයදුම්කරු එම පාඨයන්ගේ අර්ථය වටහා ගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහාය. මෙයට අමතරව සාරාංශ ලිවීම සඳහා දිග පාඨයක් දෙනු ලැබේ.

**බුද්ධි පරීක්ෂණය :** පැය දෙක (2) ක කාල සීමාවකට සීමාවන මෙය සකස් කර ඇත්තේ අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයටත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ හැකියාවත්, ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැලපෙන ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත.

**සාමාන්‍ය දැනීම :** පැය දෙක (2) ක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ, සංස්කෘතික. ආර්ථික හා පරිසරයද ඇතුලු සමස්ථය පිළිබඳව සහ ජාතික හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක, තාක්ෂණික හා කාර්මික සංවර්ධනයද සම්බන්ධයෙන් ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න කිහිපයකින් තමන් කැමති ප්‍රශ්න තෝරා ගැනීමට අවසර ඇත.

2.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකිරීම මඟින් සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින්

**3. කුසලතා මත බඳවා ගැනීම**

3.1 සුදුසුකම් :

3.1.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් /ආයතනයකින්

(i) මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හෝ

(ii) විද්‍යාවේදී විශේෂ උපාධියක් (ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ පරිගණක /තොරතුරු තාක්ෂණ විද්‍යාව ප්‍රධාන විෂයක්ලෙස) හෝ

(iii) ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් හෝ

(iv) පංති සාමාර්ථයක් සහිතව පරිගණක /තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධියක් හෝ

(v) පංති සාමාර්ථයක් සහිතව ගණිතය හෝ භෞතික විද්‍යාව විෂයයන් සහිතව සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් තිබීම

සහ

(ආ) අ.පො.ස. උසස් පෙළ සඳහා ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් සමත්ව තිබීම

3.1.2 වෘත්තීය සුදුසුකම්: අදාළ නොවේ

3.1.3 පළපුරුද්ද :

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණසේවයේ තනතුරක සේවය කරන, සේවය ස්ථිරකර ඇති නිලධාරියකු වීම සහ අවුරුදු පහකට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3.1.4 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සුදුසු සෑම අයුරකින්ම ශාරීරික යෝග්‍යතාවයක් ඇති ත්‍රිමාණ පෙනීම සහිත සහ වර්ණ අන්ධතාවය නොමැති පුද්ගලයෙකු විය යුතුය.

3.1.5 වෙනත් :

(i) පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ කිසියම් වරදක් සම්බන්ධයෙන් විනය දඬුවමකට භාජනය වී නොතිබීම.

3.1.6 උපරිම වයස් සීමාව : වයස් සීමාවකින් තොරව

3.2 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

3.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. කාර්ය සාධනය (කාර්ය සාධන වාර්තා අනුව) | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරණු ලබන ලකුණු | අදාළ නොවේ. |
| 2. සේවාකාලය | පරිපාටියකට අනුකූලව ලකුණු ලබාදෙනු ලැබේ | |

3.2.1.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : සර්වේයර් ජනරාල්

3.2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එම අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

3.2.2.1 ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සහ ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් අදාළ අයදුම්කරුවන් විසින් සපුරා තිබේදැයි පරීක්ෂා කිරිම සහ සාමාන්‍ය කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

3.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකිරිම මගින් හෝ දෙපාර්තමේන්තු චක්‍රලේඛ මගින් සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින්

3.4 ආධුනික මිනින්දෝරු තනතුරට හිමි වැටුප් ඛණ්ඩය හා වැටුප් පරිමාණය

MN-5-2016

රු. 34,605 - 10 X 660 - 11 X 755 - 15 X 930 - 63,460/-

පරිශිෂ්ටය "ආ"

**ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව - කාර්යක්ෂමතා කඩඉම්**

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ තුනකි.

**1 වන කාර්යක්ෂමතා කඩඉම :**

සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරියෙකු සේවයට බඳවා ගැනීමේ දින සිට වසර 3ක් සම්පූර්ණ කිරීමට පෙර පහත විෂය නිර්දේශය සහිත ලිඛිත පරීක්ෂණයක් වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. පහත ප්‍රශ්න පත්‍ර දෙක සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම ලකුණු 40ක් බැගින් ලබා ගත යුතුය.

| | ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හා නිත්‍ය නියෝග | පැය 3 | 100 | 40 |
| 2 | ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති සහ මුදල් රෙගුලාසි | පැය 3 | 100 | 40 |

**1 දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හා නිත්‍ය නියෝග**

දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි, තාක්ෂණික උපදෙස්, නිත්‍ය නියෝග, රජයේ ටෙන්ඩර් පටිපාටිය හා සම්බන්ධ එක් ප්‍රශ්න පත්‍රයකි.

**2. ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති සහ මුදල් රෙගුලාසි**

මෙය ආයතන සංග්‍රහයේ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල හා මුදල් රෙගුලාසි වල පහත සඳහන් විෂයයන්ට අදාළ කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයකි.

(අ) මුදල් රෙගුලාසි (X වැනි පරිච්ඡේදය හැර)

(ආ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXVIII, XXV, XXVI, XXVIII, XXIX, XXX, XXXI, XXXIII, XLVIII

(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කර ඇති කාර්යපටිපාටි රීති සංග්‍රහය (සංශෝධනද ඇතුලත්ව)

**2 වන කාර්යක්ෂමතා කඩඉම:**

II වැනි ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමෙන් වසර තුන (3) ක් සම්පූර්ණ කිරීමට පෙර පහත විෂය නිර්දේශය සහිත ලිඛිත පරීක්ෂණයක් වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. පහත ප්‍රශ්න පත්‍ර දෙක සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම ලකුණු 40ක් බැගින් ලබා ගත යුතුය.

| | ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | ඉඩම් නීතිය සහ ඉඩම් මැනීම | පැය 3 | 100 | 40 |
| 2 | ක්ෂේත්‍ර මැනුම් කළමනාකරණය | පැය 3 | 100 | 40 |

(1) ඉඩම් නිතිය සහ ඉඩම් මැනීම - ඉඩම් නිතිය, ඉඩම් පරිපාලනය, නවීන මැනුම් තාක්ෂණය හා කැඩස්තර මැනුම් සම්බන්ධ එක් ප්‍රශ්න පත්‍රයකි.

(2) ක්ෂේත්‍ර මැනුම් කළමනාකරණය - කළමනාකරණය හා කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරිම සම්බන්ධ එක් ප්‍රශ්න පත්‍රයකි.

**3 වන කාර්යක්ෂමතා කඩඉම :**

I වැනි ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් වීමෙන් වසර පහ (5) ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට පෙර මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විසින් හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන මැනුම් විද්‍යාව හෝ කළමනාකරණය පිළිබඳව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා වූ කෙටිකාලීන පාඨමාලා පහක් (05) ක් සම්පූර්ණ කර තිබිය යුතුය.

පරිශිෂ්ටය "ඈ"

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පහත දක්වා ඇති ඕනෑම දෙපාර්තමේන්තුවක අනුමත තනතුරු සංඛ්‍යාවේ ඇති විශේෂ හා I, II, III ශ්‍රේණිවලට පත් කරන ලද රාජ්‍ය නිලධාරින්ගෙන් සමන්විත වනු ඇත.

1. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
2. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
3. දුම්රිය දෙපාර්තමේන්තුව
4. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පරිශිෂ්ටය "ඇ"

01. විභාගයේ නම : ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III වන ශ්‍රේණියට පත් කිරීමේදී ජ්‍යෙෂ්ඨතාවය තීරණය කිරීම සඳහා පවත්වනු ලබන විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III වන ශ්‍රේණියට පත් කිරීමේ දී ජ්‍යෙෂ්ඨතාවය තීරණය කිරීම සඳහා පහත විෂය නිර්දේශ සහිත ලිඛිත පරීක්ෂණයක් පැවැත්වේ. අදාළ අපේක්ෂකයන් එම ප්‍රශ්න පත්‍ර 02 න් ලබා ගන්නා ලකුණුවල සාමාන්‍යය මත ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලැබේ.

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය* |
|---|---|---|
| 1 | ප්‍රායෝගික බිම් මැනීම හා මට්ටම් ගැනීම (Practical surveying & Leveling) | පැය 03 |
| 2 | මැනුම් තොරතුරු කළමනාකරණය (Survey Information Management) | පැය 03 |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය

01. ප්‍රායෝගික බිම් මැනීම හා මට්ටම් ගැනීම

(i) තිරස් සිරස් පාලන ජාල භාවිතය හා පිහිටවීම.
(ii) මැනීමේ, මට්ටම් ගැනීමේ උපකරණ භාවිතය හා නිරවද්‍යතාවය.
(iii) බිම් මැනීම සඳහා මානව හා භෞතික සම්පත් කළමනාකරණය
(iv) විවිධ දත්ත ප්‍රභව මගින් අවකාශයීය / අවකාශයීය නොවන දත්ත රැස් කිරීම. (ඉඩම් විස්තර හා ඒ අනුසාරයෙන් අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි පිඹුරු / අංකිත දත්ත පිළියෙල කිරීම )
(v) ඉඩම් තොරතුරු රැස් කිරීම හා පද්ධතිගත කිරීම.
(vi) රජයේ / පුද්ගලික ඉඩම් හඳුනාගැනීම
(vii) එක් එක් ඉඩම් සඳහා පවතින නීති රාමු හඳුනාගැනීම
(viii) භූ ලක්ෂණාත්මක පිඹුරු සකස් කිරීම.

02. මැනුම් තොරතුරු කළමනාකරණය

(i) විවිධ මැනුම් ඉල්ලීම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම
(ii) බිම් මැනුම් වාර්තා පිළියෙල කිරීම. (ජානල ඇතුළුව)
(iii) රක්ෂිත හා පොදු කටයුතු සඳහා බිම වෙන්කිරීමට අවශ්‍ය අවබෝධය
(iv) සම්බන්ධිත ආයතන සම්බන්ධීකරණය

01 - 166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.